ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2017 නොවැම්බර් මස 02 වැනි දින |

## පළාත් දළ දේශීය නිෂ්පාදිතය - 2016

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන නාමික අගය මත දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) පළාත් අනුව බෙදා හැරීමෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2016 වසර සඳහා පළාත් දළ දේශීය නිෂ්පාදිතය (ප.ද.දේ.නි.) ගණනය කරන ලදී. සමස්ත දළ දේශීය නිෂ්පාදිතය පළාත් අනුව ගණනය කිරීමේදී එහි එක් එක් අයිතමයේ වටිනාකමට අදාල පළාත් මට්ටමින් සකස් කරගත් දර්ශක යොදා ගන්නා ලදී.

2016 වසරේ දී නාමික අගය අනුව දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 11,839 දක්වා සියයට 8.1[1] කින් වර්ධනය වූ අතර ඒක පුද්ගල ආදායම රුපියල් 558,363 (එ. ජ. ඩොලර් 3,835) ක් විය. 2016 වසරේ පළාත් දළ දේශීය නිෂ්පාදිතයෙහි සමස්ත ක්‍රියාකාරිත්වය රටෙහි සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙහි සාමාන්‍ය ප්‍රවණතාව සහ ආර්ථික කටයුතුවල වර්ධනය වීම පිළිබිඹු කරයි. කෘෂිකාර්මික කටයුතුවල මන්දගාමී ක්‍රියාකාරිත්වය, කෘෂිකර්මාන්ත අංශය ප්‍රධාන ආර්ථික අංශය බවට පත්වූ පළාත්වල මන්දගාමී ක්‍රියාකාරිත්වයට හේතු විය. බස්නාහිර පළාත, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 39.7 කට දායක වෙමින් සමස්ත ආර්ථික ක්‍රියාකාරිත්වය අඛණ්ඩව මෙහෙයවනු ලැබුව ද, ප්‍රාදේශීය ආර්ථික කටයුතු වර්ධනය වීම සමඟ අනෙකුත් පළාත්වල දායකත්වය ක්‍රමයෙන් වර්ධනය විය.

---

[1] මූර්ත අගය අනුව, 2016 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය පෙර වසරේ දී වාර්තා වූ සියයට 4.8 ක වර්ධනයට සාපේක්ෂව සියයට 4.4 කින් වර්ධනය විය.

## පළාත් අනුව දළ දේශීය නිෂ්පාදිතය සඳහා දායකත්වය

පවත්නා වෙළෙඳපොළ මිල අනුව ගණනය කළ පළාත් දළ දේශීය නිෂ්පාදිතය සංඛ්‍යා සටහන 1 හි දක්වා ඇත. රු. බිලියන 4,697 ක ඉහළම දායකත්වය බස්නාහිර පළාතෙන් වාර්තා වූ අතර දෙවන සහ තෙවන දායකත්වය පිළිවෙළින් රු. බිලියන 1,262 ක් ලෙස සහ රු. බිලියන 1,248 ක් ලෙස වයඹ සහ මධ්‍යම පළාත් විසින් ලබාදෙන ලදී. දකුණු පළාත, 2016 වසරේ දී රු. බිලියන 1,190 ක දායකත්වය සමඟින් හතරවන ස්ථානය වාර්තා කළේය.

**සංඛ්‍යා සටහන 1**

**පළාත් අනුව නාමික දළ දේශීය නිෂ්පාදිතය 2015[1] සහ 2016[2]**


| පළාත | 2015 (1) (රු. බිලියන) | 2016 (2) (රු. බිලියන) |
|---|---|---|
| මධ්‍යම | 1,161 | 1,248 |
| නැගෙනහිර | 625 | 681 |
| උතුරු මැද | 644 | 687 |
| වයඹ | 1,163 | 1,262 |
| උතුරු | 452 | 495 |
| සබරගමුව | 825 | 892 |
| දකුණු | 1,106 | 1,190 |
| ඌව | 611 | 687 |
| බස්නාහිර | 4,365 | 4,697 |
| **ශ්‍රී ලංකාව** | **10,952** | **11,839** |

1.සංශෝධිත 2. තාවකාලික

දළ දේශීය නිෂ්පාදිතයට පළාත් අනුව දායකත්වය රූප සටහන 1 මගින් දක්වා ඇත. ඒ අනුව, සියයට 10 ක් හෝ ඊට වැඩි දායකත්වයක් බස්නාහිර, වයඹ, මධ්‍යම සහ දකුණු පළාත් විසින් වාර්තා කරන ලදී.

**රූප සටහන 01**

**පළාත් අනුව දළ දේශීය නිෂ්පාදිතය සඳහා දායකත්වය 2015 සහ 2016**



මෑත කාලීනව දක්නට ලැබුණු පළාත්බද විෂමතාවයන් අඩුවීමේ ප්‍රවණතාව තවදුරටත් පෙන්නුම් කරමින් 2016 වසරේ දී බස්නාහිර පළාත ද.දේ.නි. යට දක්වන දායකත්වය පහත වැටුණි. කෙසේ නමුත්, බස්නාහිර පළාත, ද.දේ.නි. යට සියයට 39.7ක ඉහළ දායකත්වයක් ලබාදෙමින් ආර්ථිකය මෙහෙයවන ප්‍රධාන පළාත බවට තවදුරටත් පත්විය.

ද.දේ.නි. යට දෙවන ඉහළම දායකත්වය වයඹ පළාතෙන් වාර්තා වූ අතර එය 2015 වසරේ දී වූ සියයට 10.6 සිට 2016 වසරේ දී සියයට 10.7 දක්වා වැඩි වී ඇත. මධ්‍යම පළාත ද.දේ.නි. යට තෙවන ඉහළම දායකත්වය වාර්තා කළ අතර එහි දායකත්වය 2015 වසරේ දී වූ සියයට 10.6 සිට 2016 වසරේ දී සියයට 10.5 දක්වා සුළු ප්‍රමාණයකින් අඩු විය. ඌව සහ උතුරු පළාත්වල ද.දේ.නි. දායකත්වයන් පිළිවෙළින් 2015 වසරේ වාර්තා කළ සියයට 5.6 සහ සියයට 4.1 සිට 2016 වසරේ දී සියයට 5.8 සහ සියයට 4.2 දක්වා සුළු වශයෙන් වර්ධනය විය . උතුරු මැද පළාත හැරුණු විට අනෙකුත් පළාත් වන දකුණු, සබරගමු, නැගෙනහිර පළාත්වල ද.දේ.නි. දායකත්වයන් 2016 වසරේ දී පිළිවෙළින් සියයට 10.1, සියයට 7.5 සහ සියයට 5.7 ලෙස නොවෙනස්ව පැවතුණි. ද.දේ.නි. යට උතුරු මැද පළාත විසින් දක්වන දායකත්වය 2015 වසරේ දී වාර්තා කළ සියයට 5.9 සිට 2016 වසරේ දී සියයට 5.8 දක්වා අඩු වූ අතර කෘෂිකාර්මික කටයුතුවල පැවති මන්දගාමී ක්‍රියාකාරිත්වය මේ සඳහා මූලිකවම හේතු විය.

## පළාත් ද.දේ.නි. යේ වර්ධන අනුපාත

2016 වසරේ දී සියලුම පළාත් ධනාත්මක නාමික වර්ධන අනුපාතයන් වාර්තා කළ අතර (සංඛ්‍යා සටහන 02) ඌව පළාත සියයට 12.4 ක ඉහළ නාමික වර්ධන අනුපාතයක් වාර්තා කළේය. දෙවන සහ තෙවන ඉහළ වර්ධන අනුපාතයන් වන සියයට 9.5 සහ සියයට 8.9 පිළිවෙළින් උතුරු සහ නැගෙනහිර පළාත්වලින් වාර්තා විය. වයඹ සහ සබරගමුව පළාත්වල වර්ධන වේගය රටෙහි නාමික වර්ධන අනුපාතය වන සියයට 8.1 ට වඩා ඉහළ අගයක පැවතුණි.

**සංඛ්‍යා සටහන 02**

**පළාත් අනුව ද.දේ.නි. යේ නාමික වර්ධන වේගයන් - 2015[1] සහ 2016[2]**

| පළාත | 2015 (1) (%) | 2016 (2) (%) |
|---|---|---|
| මධ්‍යම | 6.6 | 7.5 |
| නැගෙනහිර | 10.0 | 8.9 |
| උතුරු මැද | 14.7 | 6.7 |
| වයඹ | 4.5 | 8.5 |
| උතුරු | 11.1 | 9.5 |
| සබරගමුව | 12.7 | 8.2 |
| දකුණු | 7.0 | 7.6 |
| ඌව | 8.6 | 12.4 |
| බස්නාහිර | 1.6 | 7.6 |
| **ශ්‍රී ලංකාව** | **5.7** | **8.1** |

1.සංශෝධිත 2. තාවකාලික

## පළාත් දළ දේශීය නිෂ්පාදිතයෙහි ආංශික සංයුතිය

පළාත් අනුව ද.දේ.නි. යට ආර්ථික ක්‍රියාකාරකම් දැක් වූ දායකත්වය සංඛ්‍යා සටහන 03 හි දක්වා ඇත. පළාත් අතර ද.දේ.නි. හි සංයුතියේ සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය කළ හැකි වුවද, පසුගිය වසර 02 ක කාලය සැලකීමේ දී පළාත් තුළ ද.දේ.නි. හි සංයුතිය ආසන්න වශයෙන් නොවෙනස්ව පැවතුණි.

**සංඛ්‍යා සටහන 03**

**පළාත් අනුව ද.දේ.නි. හි ආංශික සංයුතිය (%)- 2015 සහ 2016[2]**

| පළාත | කෘෂිකර්මාන්ත | | කර්මාන්ත | | සේවා | |
|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2015 | 2016 | 2015 | 2016 |
| මධ්‍යම | 10.8 | 10.5 | 21.4 | 21.0 | 60.6 | 60.1 |
| නැගෙනහිර | 13.2 | 12.2 | 24.7 | 24.9 | 54.9 | 54.5 |
| උතුරු මැද | 12.7 | 10.7 | 19.0 | 19.3 | 61.0 | 61.6 |
| වයඹ | 11.5 | 10.0 | 26.7 | 26.5 | 54.5 | 55.0 |
| උතුරු | 12.2 | 12.6 | 22.9 | 24.6 | 57.6 | 54.4 |
| සබරගමුව | 8.7 | 7.6 | 24.2 | 25.8 | 59.8 | 58.1 |
| දකුණු | 14.5 | 13.5 | 16.9 | 17.2 | 61.3 | 60.9 |
| ඌව | 14.7 | 13.1 | 25.4 | 27.4 | 52.6 | 51.1 |
| බස්නාහිර | 2.1 | 2.1 | 34.6 | 33.3 | 56.0 | 56.2 |
| ශ්‍රී ලංකාව | **8.2** | **7.5** | **27.3** | **27.1** | **57.3** | **57.0** |

[2] භාණ්ඩ හා සේවා මත පනවන ලද බදු සහ සහනාධාර වට්ටම් ඇතුළත්ව නොමැති බැවින්, කෘෂි කර්මාන්ත , කර්මාන්ත සහ සේවාවන්හි ප්‍රතිශතාත්මක දායකත්වයන්හි එකතුව 100 ට සමාන නොවේ.

2016 වසරේ දී කෘෂිකර්මාන්ත අංශය බස්නාහිර පළාතේ ද.දේ.නි. යට සියයට 2.1 ක දායකත්වයක් දක්වන ලද අතර, අනෙකුත් පළාත්වල එහි දායකත්වය සියයට 7.6 ත් සියයට 13.5 ත් අතර පැවතුණි. 2015 වසර සමඟ සැසඳීමේ දී, උතුරු පළාතේ ද.දේ.නි. යට කෘෂිකර්මාන්ත අංශයෙහි දායකත්වය සුළු වශයෙන් ඉහළ ගිය අතර, අනෙකුත් සියලුම පළාත්වල මෙම දායකත්වය පහත වැටුණි.

මධ්‍යම, වයඹ සහ බස්නාහිර පළාත් හැරුණුකොට අනෙකුත් සියලුම පළාත්වල ද.දේ.නි. යට කාර්මික අංශයේ දායකත්වය වැඩි වී ඇත. 2016 වසරේ දී පළාත් ද.දේ.නි. යට කාර්මික අංශයෙන් ලබාදුන් ඉහළම දායකත්වය බස්නාහිර පළාතෙන් ලැබී ඇති අතර, අඩුම දායකත්වය දකුණු පළාතෙන් පෙන්නුම් කරයි.

සේවා අංශය, පළාත් ද.දේ.නි. තුළ සියයට 51.1 ත් සියයට 61.6 ත් අතර ප්‍රතිශතයක් වාර්තා කරමින් සියලුම පළාත් තුළ ප්‍රමුඛතම අංශය බවට පත් වී ඇත. කෙසේ නමුත්, 2015 වසර සමඟ සැසඳීමේ දී, උතුරු මැද, වයඹ සහ බස්නාහිර පළාත්වල සේවා අංශයෙන් ලැබුණු දායකත්වය ඉහළ ගිය අතර අනෙකුත් සියලුම පළාත්වල එම අගයෙහි අඩුවීමක් පෙන්නුම් කරයි.

## පළාත් අනුව ඒක පුද්ගල ආදායම

පළාත් අනුව ඒක පුද්ගල නාමික ආදායම සංඛ්‍යා සටහන 04 හි දක්වා ඇත.

**සංඛ්‍යා සටහන 04**

**පවත්නා වෙළඳ මිල අනුව පළාත් අනුව ඒක පුද්ගල ආදායම - 2015² 2016³**

| පළාත | 2015 (1) (රු.) | අනුපාතය | 2016 (2) (රු.) | අනුපාතය |
|---|---|---|---|---|
| මධ්‍යම | 436,819 | 0.8 | 463,863 | 0.8 |
| නැගෙනහිර | 386,911 | 0.7 | 413,720 | 0.7 |
| උතුරු මැද | 490,653 | 0.9 | 516,388 | 0.9 |
| වයඹ | 475,084 | 0.9 | 509,602 | 0.9 |
| උතුරු | 413,343 | 0.8 | 447,260 | 0.8 |
| සබරගමුව | 414,948 | 0.8 | 444,156 | 0.8 |
| දකුණු | 432,577 | 0.8 | 460,569 | 0.8 |
| ඌව | 464,405 | 0.9 | 515,437 | 0.9 |
| බස්නාහිර | 730,070 | 1.4 | 779,184 | 1.4 |
| ශ්‍රී ලංකාව | **522,355** | **1.0** | **558,363** | **1.0** |

1 නවතම ජනගහන දත්ත අනුව 2 සංශෝධිත 3 තාවකාලික

සියලුම පළාත්වල ඒක පුද්ගල ආදායම ඉහළ ගිය අතර බස්නාහිර පළාතේ ඒක පුද්ගල ආදායම පමණක් පසුගිය වසර දෙක තුළ දී වාර්තා වූ දිවයිනේ සමස්ත ඒක පුද්ගල ආදායම් තත්වයන් ඉක්මවා ගියේය. සියලුම පළාත්වල ඒක පුද්ගල ආදායම් අනුපාතිකය සහ දිවයිනේ සමස්ත ඒක පුද්ගල ආදායම් අනුපාතිකය සංඛ්‍යා සටහන 04 මගින් දක්වා ඇති අතර, 2015 සහ 2016 වසර වල දී එම අනුපාතිකය නොවෙනස්ව පැවැති ආකාරය එමඟින් පිළිබිඹු කරයි.